සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - ඌව පළාත
DEPARTMENT OF HEALTH SERVICES - UVA PROVINCE
சுகாதார சேவைத் திணைக்களம் -ஊவா மாகாணம்
අංක 301 ආර් එච් ගුණවර්ධන මාවත - බදුල්ල # 301, R.H. Gunawardana Mawatha, Badulla.

මගේ අංකය / My No. UH/EC/වා.ස්.මා./2026 ඔබේ අංකය / Your No. ………… දිනය / Date 2026.05.02

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
බදුල්ල/මොණරාගල,

වෛද්‍ය අධිකාරි,
මූලික රෝහල,
මහියංගනය, දියතලාව, වැලිමඩ, බණ්ඩාරවෙල
සියඹලාණ්ඩුව, වැල්ලවාය, බිබිල,
සහ
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින
අනෙකුත් ආයතන ප්‍රධානීන් වෙත,

**<u>ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු නියෝග - 2026</u>**

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් සේවා ස්ථාන වල සේවයේ නියුතු මහජන සෞඛ්‍ය පරීක්ෂක, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී, සහ PL කාණ්ඩයට අයත් කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ තනතුරු වල (රියදුරු සේවය හැර) නිලධරයන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු වලට අදාළ ස්ථාන මාරු කමිටුවේ යෝජනා හා අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව ස්ථාන මාරු තීරණ මෙ සමග නිකුත් කරමි.

02. එහි විශේෂ සඳහනක් නොමැති සියළුම ස්ථාන මාරු 2026.05.11 දින සිට ක්‍රියාත්මක කිරීමට මෙයින් නියෝග කරනු ලැබේ

03. මෙම ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරුවීම් ලබා ඇති සියළුම නිලධරයන්ට ලිඛිතව දැනුම් දී නියමිත දින නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවනසේ නිදහස් කිරීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.

04. එසේම අදාළ නිලධරයන් භාරයේ ඇති රජය සතු ලිපිලේඛන, ලිපිගොනු, පරිගණක මුරපද හා රජයේ දේපළ නිසි පරිදි භාර ගැනිමට ආයතන ප්‍රධානීන් විසින් පියවර ගත යුතුය. ඒ අනුව ස්ථානමාරුලාභීන් විධිමත් පරිදි නිදහස් කර ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු වැටුප් විස්තර, නිවාඩු විස්තර හා ලබාගත් දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර නිවැරැදිව නව සේවා ස්ථානයේ ආයතන ප්‍රධානීන් වෙත යැවිමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වෙ.

05. තවද , අනුමත කාර්ය මණ්ඩල වාර්තාවට අනුව සේවා ස්ථාන වල අතිරික්තව සිටින නිලධාරින් සහ සේවකයින් ස්ථාන මාරු කර ඇති බැවින් ඔවුන් අනුප්‍රාප්තිකයෙකු රහිතව නිදහස් කිරීමට අදාල ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.

06. මෙම ස්ථාන මාරු නියෝග ඇතුලත් ලේඛනය www.healthdept.up.gov.lk යන වෙබ් ලිපිනයෙන් බාගත කරගත (Download) හැකි බව දන්වන අතර, අදාල ස්ථාන මාරු නියෝග ලද නිලධරයන් අනුප්‍රාප්තික නිලධරයන් පැමිණෙන තෙක් නොසිට නිදහස් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි. එසේ කටයුතු නොකරන ආයතන ප්‍රධානීන් හට විනයානුකූල කටයුතු කිරීමට සිදුවන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

විශේෂඥ වෛද්‍ය
ඩබ්ලිව්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න
MBBS.MSC,MD Medical Adiministration
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - බදුල්ල

විශේෂඥ වෛද්‍ය ඩබ්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත්
ලේකම්, ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස

**Telephone Numbers**
General : 055- 4938052 Fax : 055-2223098 / 055-2222823 Provincial Director : 055-4938040
MO Planning : 055- 4938044 Accountant : 055 - 4938041 / 055-2231981 Administrative Officer : 055-4938043 / 055-2229694

**Email :**
pdhsplanning@gmail.com
uvaprovince.pdhs2020@gmail.com
pdhsuvaacc@gmail.com